# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2053/42 - 2018 ජනවාරි මස 12 වැනි සිකුරාදා - 2018.01.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත

### 4 (2) උපවගන්තිය යටතේ කරනු ලබන පළකිරීම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය (මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙත පැවරී ඇති බලතල අනුව, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනතේ අරමුණ සඳහා 2018 ජනවාරි 01 දින සිට බලාත්මක කරන ශ්‍රී.ලං.ගි.ප්‍ර.9 ට සංශෝධන - සෘණාත්මක හානිපූර්ණය සමඟ කලින් ගෙවීම් ලක්‍ෂණ ආයතනය විසින් සම්මත කර මේ සමඟ පළකර ඇත. මෙම ශ්‍රී.ලං.ගි.ප්‍ර.9 ට සංශෝධන - සෘණාත්මක හානිපූර්ණය සමඟ කලින් ගෙවීම් ලක්‍ෂණ වර්ෂ දෙදහස් දහඅටේ ජනවාරි පළමු දින හෝ ඊටපසු ආරම්භ වන කාලපරිච්ඡේද ආවරණය කෙරෙන මූල්‍ය ප්‍රකාශ සඳහා බලාත්මක කළ යුතුය. කලින් ව්‍යවහාර කිරීමට අවසර ඇත.

ආයතනයේ පාලක සභාවේ අණ පරිදි,

අරුණ අල්විස්,
ලේකම්.

2018 ජනවාරි මස 12 වැනි දින,
කොළඹ 07,
මලලසේකර මාවත,
අංක 30 ඒ,
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ දී ය.

## ශ්‍රී.ලං.ගි.ප්‍ර.9 ට සංශෝධන - සෘණාත්මක හානිපූර්ණය සමඟ කලින් ගෙවීම් ලක්‍ෂණ

7.1.7 ඡේදය එකතු කරන ලදී. අළුත් ශීර්ෂයක් සහ 7.2.29-7.2.34 ඡේද එකතු කරන ලදී.

### 7 පරිච්ඡේදය - බලාත්මක දිනය සහ සංක්‍රාන්තිය

### 7.1 බලාත්මක දිනය

7.1.7 2017 දෙසැම්බර් හි නිකුත් කල *සෘණාත්මක හානිපූර්ණය සමඟ කලින් ගෙවීම් ලක්‍ෂණ* (ශ්‍රී.ලං.ගි.ප්‍ර. 9 ට සංශෝධන), 7.2.29-7.2.34 සහ ආ4.1.12(අ) ඡේද එකතු කරන ලද අතර ආ. 4.1.11 (ආ) සහ ආ4.1.12 (ආ) ඡේද සංශෝධන කරන ලදී. අස්තිත්ත්වයක් 2019 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භවන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා මෙම සංශෝධන ව්‍යවහාර කල යුතු වේ. කලින් ව්‍යවහාර කිරීමට ඉඩ දෙනු ලැබේ. අස්තිත්ත්වයක් පෙර කාලපරිච්ඡේදයක් සඳහා මෙම සංශෝධන ව්‍යවහාර කරයි නම් එම කරුණ හෙළිදරව් කළයුතු වේ.

### 7.2 සංක්‍රාන්තිය

#### සෘණාත්මක *හානිපූර්ණය* සමඟ කලින් ගෙවීම් ලක්‍ෂණ සඳහා සංක්‍රාන්තිය

7.2.29 අස්තිත්ත්වයක් 7.2.30-7.2.34 ඡේදවල විශේෂයෙන් සඳහන් කර ඇති දෑ හැර ශ්‍රී.ලං.ගි.ප්‍ර. 08 (LKAS 8) අනුව *සෘණාත්මක හානිපූර්ණය සමඟ කලින් ගෙවීම් ලක්‍ෂණය* (ශ්‍රී.ලං.ගි.ප්‍ර. 9 (SLFRS 9) ට සංශෝධන) අතීතානුයෝගිව ව්‍යවහාර කලයුතු වේ.

7.2.30 මෙම සංශෝධන ප්‍රථමවරට ව්‍යවහාර කරන අස්තිත්ත්වයක් ඒ සමගම මෙම ප්‍රමිතිය ප්‍රථමවරට ව්‍යවහාර කරන විට 7.2.31-7.2.34 ඡේද වෙනුවට 7.2.1-7.2.28 ඡේද ව්‍යවහාර කළයුතු වේ.

7.2.31 මෙම ප්‍රමිතිය ප්‍රථමවරට ව්‍යවහාර කිරීමෙන් පසු මෙම සංශෝධන අස්තිත්ත්වයක් ප්‍රථමවරට ව්‍යවහාර කරන විට 7.2.32-7.2.34 ඡේද ව්‍යවහාර කළ යුතුවේ. අස්තිත්ත්වය මෙම සංශෝධන ව්‍යවහාර කිරිම සඳහා මෙම ප්‍රමිතියේ අවශ්‍ය වන *අනෙකුත්* සංක්‍රාන්ති අවශ්‍යතාවයන්ද ව්‍යවහාර කළයුතු වේ. එම අරමුණ සඳහා අස්තිත්ත්වය මෙම සංශෝධන ප්‍රථමවරට ව්‍යවහාර කරන (මෙම සංශෝධන මුල්වරට ව්‍යවහාර කරන දිනය) වාර්තාකරණ කාලපරිච්ඡේදය ආරම්භයට යොමුවක් ලෙස මුල් ව්‍යවහාර කිරීමේ දිනයට යොමුවන් කියවිය යුතු වේ.

7.2.32 ලාභය හෝ අලාභය තුලින් සාධාරණ අගයට මනිනු ලබන ලෙස මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වගකීමක් හඳුන්වාදීම සම්බන්ධයෙන්, අස්තිත්ත්වයක්;

(අ) 4.1.5 ඡේදයේ කොන්දේසිය ප්‍රකාරව එම හඳුන්වාදීම සිදු කර ඇත්නම් එහෙත් මෙම සංශෝධන ව්‍යවහාර කිරීමේ ප්‍රතිඵලයක් ලෙස එම කොන්දේසිය තවදුරටත් සපුරන්නේ නොමැති විට ලාභය හෝ අලාභය තුලින් සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කමක එහි කලින් හඳුන්වාදීම අහෝසි කල යුතු වේ;

(ආ) 4.1.5 ඡේදයේ කොන්දේසිය මගින් එම හඳුන්වාදීම කලින් සපුරන්නේ නැත්නම් එහෙත් මෙම සංශෝධන ව්‍යවහාර කිරීමේ ප්‍රතිඵලයක් ලෙස එම කොන්දේසි දැන් සපුරන විට ලාභය හෝ අලාභය තුලින් සාධාරණ අගය ලෙස මනින ලද මූල්‍ය වත්කමක් හඳුන්වා දිය හැකිය;

(ඇ) 4.2.2 (අ) ඡේදයේ කොන්දේසිය ප්‍රකාරව එම හඳුන්වාදීම කලින් සිදු කර ඇත්නම් එහෙත් මෙම සංශෝධන ව්‍යවහාර කිරීමේ ප්‍රතිඵලයක් ලෙස එම කොන්දේසිය තවදුරටත් සපුරන්නේ නොමැති විට ලාභය හෝ අලාභය තුලින් සාධාරණ අගයට මනින ලද මූල්‍ය වගකීමක් එහි කලින් හඳුන්වාදීම අහෝසි කල යුතු වේ ; සහ

(ඈ) 4.2.2 (ආ) ඡේදයේ කොන්දේසිය මගින් එම හඳුන්වාදීම කලින් සපුරාලන්නේ නැත්නම් එහෙත් මෙම සංශෝධන ව්‍යවහාර කිරීමේ ප්‍රතිඵලයක් ලෙස එම කොන්දේසිය දැන් සපුරන විට ලාභය හෝ අලාභය තුලින් සාධාරණ අගය ලෙස මනින ලද මූල්‍ය වගකීමක් හඳුන්වා දිය හැකිය.

එවැනි හඳුන්වා දීම හෝ අවලංගු කිරීමක් එම සංශෝධන මුල් ව්‍යවහාර කරන දිනට පවතින කරුණු සහ තත්ත්වයන් ගේ පදනම මත සිදුකළ යුතුවේ. එම වර්ගීකරණය අතීතානුයෝගිව ව්‍යවහාර කල යුතු වේ.

7.2.33 මෙම සංශෝධන ව්‍යවහාර කිරීම පිළිබිඹු කිරීමට පූර්ව කාලපරිච්ඡේද නැවත ප්‍රකාශ කිරීම අස්තිත්ත්වයකට අවශ්‍ය නොවේ. පසු දැක්ම (අපර අවබෝධය) භාවිතා කල නොහැකි නම් හා යළි ප්‍රකාශ කල මූල්‍ය ප්‍රකාශ තුලින් මෙම ප්‍රමිතියේ සියළු අවශ්‍යතාවයන් පිළිඹිබු වන්නේ නම් පමණක් අස්තිත්ත්වයකට පූර්ව කාලපරිච්ඡේද යළි ප්‍රකාශ කල හැකිය. අස්තිත්ත්වයක් පෙර කාලපරිච්ඡේද යළි ප්‍රකාශ නොකරන්නේ නම්, පෙර වූ ධාරණ වටිනාකම හා මෙම සංශෝධන ව්‍යවහාර කරන මුල් දිනය ඇතුලත් වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදය ආරම්භයේදී ඇති ධාරණ වටිනාකම අතර ඇති යම් වෙනසක්, මෙම සංශෝධන ව්‍යවහාර කරන මුල් දිනය ඇතුලත් වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයේ ආරම්භක රඳවා ගැනීමේ ඉපයීම් (හෝ උචිත වන පරිදි ස්කන්ධයේ වෙනත් සංරචකයක් තුල) අස්තිත්ත්වය විසින් හඳුනා ගත යුතුය.

7.2.34 මෙම සංශෝධන මුලින්ම ව්‍යවහාර කරන දිනය ඇතුලත් වාර්තාකරණ කාලච්ඡේදයේදී මෙම සංශෝධන මගින් බලපෑමට ලක් වූ එක් එක් මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් පන්තිය සඳහා මුලින්ම ව්‍යවහාර කරන දිනට අස්තිත්ත්වය පහත සඳහන් තොරතුරු හෙළිදරව් කලයුතු වේ.

(අ) මෙම සංශෝධන ව්‍යවහාර කිරීමට පෙර වහාම නිර්ණය කළ කලින් මැනීමේ ප්‍රවර්ගය සහ ධාරණ වටිනාකම;

(ආ) මෙම සංශෝධන ව්‍යවහාර කිරීමෙන් පසු වහාම නිර්ණය කල නව මැනීමේ ප්‍රවර්ගය සහ ධාරණ වටිනාකම;

(ඇ) එසේ තවදුරටත් හඳුන්වා නොමැති එහෙත් නමුත් ලාභය හෝ අලාභය තුලින් සාධාරණ අගයට මනින ලද කලින් හඳුන්වා දෙන ලද මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ ඕනෑම මූල්‍ය වත්කම්වල හෝ මූල්‍ය වගකීම්වල ධාරණ වටිනාකම ; සහ

(ඈ) ලාභය හෝ අලාභය තුලින් සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම්වල හෝ මූල්‍ය වගකීම්වල ඕනෑම හඳුන්වාදීමක් හෝ හඳුන්වා නොදීමක් සඳහා හේතු.

| |
|---|
| (ආ) පරිශිෂ්ඨයේ, ආ4.1.11 (ආ) සහ ආ 4.1.12 (ආ) ඡේද සංශෝධනය කර ඇත. ආ4.1.12 (අ) ඡේදය අළුතින් එකතු වේ. ආ 4.1.10 සංශෝධනය නොවන නමුත් යොමුවේ පහසුව සඳහා ඇතුලත් කර තිබේ. නව පාඨ යටින් ඉරක් ගසා ඇති අතර ඉවත් කරන පාඨ ඉරකින් කපා තිබේ. |

## වර්ගීකරණය (4 පරිච්ඡේදය)

### මූල්‍ය වත්කම් වර්ගීකරණය (4.1 කොටස)

### නොගෙවා තිබෙන මුල් මුදල මත තනිකරම මුල් මුදල සහ පොළිය වශයෙන් ගෙවීම් තිබෙන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ

*ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ වල කාල නිර්ණය හෝ මුදල වෙනස්කරන ගිවිසුම්ගත කොන්දේසි*

ආ4.1.10 මූල්‍ය වත්කමක ගිවිසුම්ගත මුදල් ප්‍රවාහවල කාල නීර්ණය හෝ වටිනාකම (උදාහරණ වශයෙන් වත්කම පරිණත වීමට කලින් ගෙවිය හැකි නම් හෝ එහි කාලය දීර්ඝ කළ හැකි නම්) වෙනස් විය හැකි ගිවිසුම්ගත කොන්දේසියක් අඩංගුවේ නම්, එම ගිවිසුම්ගත කොන්දේසි නිසා සාධන පත්‍රයේ ජීව කාලය පුරා පැන නැගිය හැකි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ, තනිකරම මුල් මුදල සහ මුල් මුදලේ නොගෙවා තිබෙන වටිනාකම මත පොලිය ගෙවීම පමණක්ද යන්න අස්තිත්ත්වය නීර්ණය කළ

යුතුය. මෙම නිර්ණය කිරීමට අස්තිත්ත්වය විසින් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ වෙනස්වීමට පෙර සහ පසුව යන අවස්ථා දෙකේදීම පැන නැගිය හැකි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ තක්සේරු කළ යුතුය. අස්තිත්ත්වය විසින් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහවල කාල නිර්ණය සහ වටිනාකම වෙනස්විය හැකි යම් අහඹු සිද්ධියක (ක්‍රියාරම්භය) ස්වභාවයද තක්සේරු කළ හැකිය. ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ තනිකරම මුල් මුදල සහ පොලිය ගෙවීමක් ද යන්න තක්සේරු කිරීමේදී අහඹු සිද්ධියේ ස්වභාවය එයම නිශ්චය කිරීමේ සාධකයක් විය නොහැකි අතර එය සූචකයක් විය හැකිය.

උදාහරණයක් වශයෙන් ණය ගැතියෙක් මූල්‍ය සාධන පත්‍රයකට ගෙවිය යුතු එක්තරා ගෙවීම් ගණනාවක් ගෙවීමට මග හැරී ඇත්නම්, එවිට ඉහළ පොලී අනුපාතිකයක් නියම කරන මූල්‍ය සාධන පත්‍රයක් සමග නිශ්චය කරන ලද ස්කන්ධ දර්ශකයක් එක්තරා මට්ටමකට පැමිණි විට, ඉහළ පොලී අනුපාතිකයට පොලිය යළි නියම කරන මූල්‍ය සාධන පත්‍රය සමග සංසන්දනය කිරීම. කලින් සඳහන් කරනලද අවස්ථාවේ බොහෝදුරට විය හැක්කේ සාධන පත්‍රයේ ජීව කාලය පුරා ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ විය යුත්තේ තනිකරම මුල් මුදල සහ නොගෙවා ඇති මුල් මුදල මත පොලිය ගෙවීම පමණකි. මෙයට හේතුවන්නේ මග හැරුන ගෙවීම් සහ ණය අවදානම් ඉහළයාම අතර ඇති සම්බන්ධතාවයයි (ආ. 4.1.18 ඡේදයද බලන්න).

ආ4.1.11 ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ප්‍රතිඵලයක් වන තනිකරම මුල් මුදල සහ මුල් මුදලේ නොගෙවා ඇති වටිනාකම මත පොලිය ගෙවීම පමණක් වන ගිවිසුම්ගත කොන්දේසි වලට උදාහරණ පහත දැක්වේ.

(අ) මුදලේ කාලීන වටිනාකම සඳහා ප්‍රතිෂ්ඨාවක් අඩංගු විචල්‍ය පොලී අනුපාතිකයක්, එක්තරා කාල පරිච්ඡේදයක් තුළ මුල් මුදලේ නොගෙවා ඇති වටිනාකම ආශ්‍රිතව ණය අවදානම (ණය අවදානම සඳහා වන ප්‍රතිෂ්ඨාව මූලික හඳුනා ගැනීමේදී පමණක් නිර්ණය කළ හැකි අතර ඒ අනුව ස්ථාවර විය හැකිය) සහ වෙනත් මූලික ණයදීමේ අවදානම් සහ පිරිවැය මෙන්ම ලාභ ආන්තිකයක් ලෙස;

(ආ) ණය සාධන පත්‍රයක් කලින් ගෙවීමට හෝ එය පරිණත වීමට පෙර නිකුත් කරන්නා හට ණය සාධන පත්‍රය ආපසු අවසර දෙන යොමු කිරීමට දරන්නාට (එනම් ණය හිමි) අවසර දෙන, නිකුත් කරන්නාට (එනම් ණයගැතියා) අවසරදෙන ගිවිසුම්ගත කොන්දේසියක් සහ කලින් ගෙවන වටිනාකම මුල් මුදල සහ මුල් මුදලේ නොගෙවා ඇති වටිනාකමට පොලිය නොගෙවූ වටිනාකම් සැහෙන දුරට නියෝජනය කරයි. එයට ගිවිසුම කලින් අවසන් කිරීම සඳහා සාධාරණ ~~අතිරේක~~ හානි පූර්ණයක් ඇතුලත් විය හැකිය; සහ

(ඇ) ණය සාධන පත්‍රයක ගිවිසුම්ගත කාලය දීර්ඝ කිරීමට නිකුත් කරන්නාට හෝ දරන්නාට අවසර දෙන (එනම් දීර්ඝ කිරීමේ විකල්පය) ගිවිසුම්ගත කොන්දේසි සහ දීර්ඝ කිරීමේ විකල්පයේ ප්‍රතිඵලය, දීර්ඝ කරන ලද කාලපරිච්ඡේදය තුළදී ගිවිසුම්ගත කොන්දේසියක් මුදල් ප්‍රවාහ තනිකරම මුල් මුදල සහ මුල් මුදලේ නොගෙවා ඇති වටිනාකම මත පොලිය ගෙවීම පමණක් වීම්, එයට ගිවිසුම දීර්ඝ කිරීම සඳහා සාධාරණ අතිරේක හානි පූර්ණයක් ඇතුලත් විය හැකිය.

ආ4.1.12 ආ4.1.10 ඡේදයේ එසේ සඳහන් වුවද 4.1.2(ආ) සහ 4.1.2අ(ආ) ඡේදවල සඳහන් කොන්දේසි වෙනත් ලෙසකින් සපුරාලිය හැකි මූල්‍ය වත්කමක්, එහෙත් නිකුත් කරන්නාට ණය සාධන පත්‍රය ආපසු ගෙවීමට අවශ්‍ය කරන හෝ කල්පිරීමට පෙර ණය සාධන පත්‍රය දරන්නා විසින් නිකුත් කරන්නා වෙත ආපසු යොමුකිරීමට අවශ්‍ය කරන ගිවිසුම්ගත කොන්දේසියක ප්‍රතිඵලයක් නිසා පමණක් එසේ නොවී (4.1.2(අ) ඡේදයේ කොන්දේසියේ හෝ4.1.2අ(ආ) කොන්දේසියේ අවශ්‍යතා ඉටුවීමට යටත්ව) අනෙකුත් විස්තීර්ණ ආදායම් හරහා ක්‍රමක්ෂය පිරිවැයට හෝ සාධාරණ වටිනාකම මත මනිනු ලැබීමට සුදුසුකම් ලබනුයේ:

(අ) ගිවිසුම්ගත සම වටිනාකමට අධි මිලකට හෝ අවමිලකට මූල්‍ය වත්කමක් අස්තිත්ත්වය අත්කර ගැනීම හෝ ආරම්භ කර තිබීම;

(ආ) කලින් ගෙවූ වටිනාකම ගිවිසුම්ගත සම වටිනාකම සහ උපචිත (එහෙත් නොගෙවූ) ගිවිසුම්ගත පොලිය සැහෙන දුරට නියෝජනය කරයි, එයට ගිවිසුම කලින් අවසන් කිරීම සඳහා සාධාරණ අතිරේක හානිපූර්ණයක් ඇතුළත් කර තිබිය හැකි වීම; සහ

(ඇ) අස්තිත්ත්වය මූල්‍ය වත්කම මුලින්ම හඳුනාගත් විට, කලින් ගෙවීමේ ලක්ෂණයේ සාධාරණ වටිනාකම සැළකිය යුතු තරම් නො වීම .

ආ.4.1.12අ ආ4.1.11(ආ) සහ ආ4.1.12 (ආ) යන ඡේද ව්‍යවහාර කිරීමේ අරමුණ සඳහා ගිවිසුම කලින් අවසන් කිරීමට හේතුවන සිද්ධියක් හෝ තත්වයක් නොසලකා, එම කාර්යය කලින් අවසන් කිරීමට සඳහා සාධාරණ වන්දියක් ගෙවීමට හැකිය. උදාහරණ ලෙස, ගිවිසුම කලින් අවසන් කිරීමට (හෝ එසේ කලින් අවසන් කිරීම සිද්ධවීමට හේතුවන) තෝරා ගන්නා විට පාර්ශවයකට සාධාරණ වන්දියක් ලැබීමට හෝ ගෙවීමට හැකිය.

## ශ්‍රී.ලං.ගි.ප්‍ර. 28 ට සංශෝධන ආශ්‍රිත හා බද්ධ ව්‍යාපාරවල දිගුකාලීන හිමිකම්

14අ සහ 45උ-45ඕ ඡේද අළුතින් එකතු කර ඇති අතර 41 ඡේදය ඉවත් කරන ලදී. ඉවත්කරන පාඨ ඉරකින් කපා හැර ඇත.

## ස්කන්ධ ක්‍රමය

14 අ ස්කන්ධ ක්‍රමය ව්‍යවහාර නොකරන ආශ්‍රිතයක හෝ බද්ධ ව්‍යාපාරයක වෙනත් මූල්‍ය සාධන පත්‍රවලට අස්තිත්වයක් ශ්‍රී.ලං.ගි.ප්‍ර. 9 ද ව්‍යවහාර කරයි. මේවාට හරයක් වශයෙන් ආශ්‍රිතයක හෝ බද්ධ ව්‍යාපාරයක අස්තිත්වයේ ශුද්ධ ආයෝජනයේ කොටසක ස්වරූපය ඒවායේ දිගුකාලීන හිමිකම් ඇතුලත් වේ (38 ඡේදය බලන්න.). අස්තිත්වයක් මෙම ප්‍රමිතියේ 38 ඡේදය සහ 40-43 ඡේද ව්‍යවහාර කිරීමට පෙර එවැනි දිගුකාලීන හිමිකම්වලට ශ්‍රී.ලං.ගි.ප්‍ර. 9 ව්‍යවහාර කරයි. ශ්‍රී.ලං.ගි.ප්‍ර. 9 ව්‍යවහාර කිරීමේදී, මෙම ප්‍රමිතිය ව්‍යවහාර කිරීම තුලින් පැන නගින දිගුකාලීන හිමිකම්වල ධාරණ අගයට කිසිදු ගැලපීම් අස්තිත්වය සැලකිල්ලට නොගත යුතුයි.

ස්කන්ධ ක්‍රමයේ ව්‍යවහාකරණය

41 ඉවත් කරන ලදී

## බලාත්මක දිනය සහ සංක්‍රාන්තිය

45උ 2017 දෙසැම්බර් නිකුත් කල *ආශ්‍රිතයක හෝ බද්ධ ව්‍යාපාරයක දිගුකාලීන හිමිකම්*, 14 අ ඡේද එකතු කර ඇති 41 ඡේදය ඉවත් කරන ලදී. 45ඌ-45ඕ ඡේදවල විශේෂයෙන් සඳහන් කර නොමැති නම් හැර 2019 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේද සඳහා ශ්‍රී.ලං.ගි.ප්‍ර. 8 අනුව අස්තිත්වයක් මෙම සංශෝධන අතීතානුයෝගීව ව්‍යවහාර කල යුතු වේ. කලින් ව්‍යවහාර කිරීමට ඉඩ දෙනු ලැබේ. අස්තිත්වයක් මෙම සංශෝධන කලින් ව්‍යවහාර කරයි නම් එම කරුණ හෙළිදරව් කල යුතු වේ.

45ඌ 45උ ඡේදයේ සංශෝධන ප්‍රථමවරට ව්‍යවහාර කරන අස්තිත්වයන් සමගම ශ්‍රී.ලං.ගි.ප්‍ර. 9 ප්‍රථමවරට ව්‍යවහාර කරන විට 14 අ ඡේදයේ විස්තර කර ඇති දිගුකාලීන හිමිකම්වලට ශ්‍රී.ලං.ගි.ප්‍ර. 9 හි සංක්‍රාන්ති අවශ්‍යතාවයන් ව්‍යවහාර කල යුතු වේ.

45එ ශ්‍රී.ලං.ගි.ප්‍ර. 9 ප්‍රථමයෙන් ව්‍යවහාර කිරීමට පසු අස්තිත්වයක් 45උ ඡේදයේ සංශෝධන ප්‍රථමයෙන් ව්‍යවහාර කරන විට දිගුකාලීන හිමිකම්වලට 14 ආ ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවයන් ව්‍යවහාර කිරීම සඳහා අවශ්‍ය වන ශ්‍රී.ලං.ගි.ප්‍ර. 9 හි සංක්‍රාන්ති අවශ්‍යතාවයන් ව්‍යවහාර කල යුතු වේ. එම අරමුණ සඳහා අස්තිත්වය සංශෝධන ප්‍රථමයෙන් ව්‍යවහාර කරන (සංශෝධන ප්‍රථමයෙන් ව්‍යවහාර කරන දිනය) වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයේ ආරම්භයට යොමුවක් ලෙස ශ්‍රී.ලං.ගි.ප්‍ර. 9 හි මුලින්ම ව්‍යවහාර කරන දිනයට යොමු කියවිය යුතු වේ. අස්තිත්වයක් සංශෝධන ව්‍යවහාර කිරීම පිළිඹිබු කිරීමට, පෙර කාලපරිච්ඡේද නැවත සටහන් කිරීමට අවශය නොවිය හැකිය. පසු දැක්මේ භාවිතයේ රහිතව සිදුකල හැකි නම් පමණක් අස්තිත්වය පෙර කාලපරිච්ඡේද නැවත ප්‍රකාශ කල හැකිය.

45ඒ 45උ ඡේදයේ සංශෝධන ප්‍රථමවරට ව්‍යවහාර කරන විට, සංශෝධන ව්‍යවහාර කිරීම පිළිබිඹු කීරිමට පෙර කාලපරිච්ඡේද යලි ප්‍රකාශ කිරීමට අවශ්‍ය නොවන ශ්‍රී.ලං.ගි.ප්‍ර. 4 " *රක්‍ෂණ ගිවිසුම* අනුව ශ්‍රී.ලං.ගි.ප්‍ර. 9 මගින් තාවකාලික නිදහස් කිරීම අස්තිත්වයේ ව්‍යවහාර කරයි. අස්තිත්ත්වය පසු දැක්මේ භාවිතය රහිතව සිදුකල හැකි නම් පමණක් පෙර කාලපරිච්ඡේද නැවත ප්‍රකාශ කළ හැකිය.

සංශෝධනවල යලි ප්‍රකාශ මුලින්ම ව්‍යවහාර කරන දිනට 45එ හෝ 45ඒ ඡේද ව්‍යවහාර කරමින් අස්තිතත්වයක් , පෙර කාලපරිච්ඡේද යලි ප්‍රකාශ නොකරයි නම්, එය පහත දෑ අතර ඕනෑම වෙනසක් ආරම්භක රඳවාගත් ඉපයීම් තුල හඳුනාගත යුතු වේ (හෝ යෝග්‍ය පරිදි ස්කන්ධයේ වෙනත් සංරචකයක).

(අ) එදිනට 14 අ ඡේදයේ විස්තර කළ දිගුකාලීන හිමිකම්වල කලින් ධාරණ වටිනාකම ; සහ

(ආ) එදිනට එම දිගුකාලීන හිමිකම්වල ධාරණ වටිනාකම .

12-03

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.